# ලොවට හුරු පුරුදු අත් හරිමින් යාම

පොල් ගසෙකැ හැදී-වැඩී-වියැලී බිමට වැටෙන පොල් ගෙඩිය ඔබට කියා දෙන පාඩම තුළින් ඔබ ලෝ දහම ද දැකැගත්තෙහි ද ? තම තුරුලෙහි හැදී වැඩී, කලක් තිස්සේ පැහැපත් වැ පවතින පොල් ගෙඩිය ලොවට ආවේනික වූ අනියත බව පසක් කරමින් දිනෙකැ මව් තුරුළෙන් ඉවත් වැ බිමැ පතිත වීම ලොවෙහි නියාම දහමෙකි.

වියැලුණු පොල් ගෙඩිය වැස්සට තෙමෙමින්, අව්වට වේලෙමින් කිසියම් කලක් පොළව මත තිබෙණ විටැ, ගෙඩියේ මුහුණතින් පිටතට ඇදෙන කහ පැහැති, සිනිඳු ගොබය පෙනෙන්නට ගනියි. තවත් කලක් යන විටැ ගෙඩියේ යට පැත්තෙන් සිනිඳු පොල්මුල එළියට බසිමින් පොළොවෙහි පස වැළැඳ ගන්නා අයුරු ද දිස්වෙයි. පොල් පැල වැඩෙමින් වසරක් පමණ ගත වෙද්දී පැලයට උපත දුන්, පැලය වැඩෙන්නට තම හදවත වන් වූ පැල මදය පුද දුන්, දිරාපත් වන පොල් ගෙඩිය වැඩෙන පැලයෙන් වෙන් වී යයි. ඉන්පසු පොල් ලෙල්ලත්, පොල් කටුවත් දෙක මැ පොළවට පස් වී යයි.

මෙම සිදුවීම් ජාලය සාමාන්‍ය දෙයක් සේ සලකා, අප විසින් අමතක කරැ දැමීම සිරිත වුවත්, මිනිසාට එහි ඇති සමානත්වය ගැන සිතා බලතොත් මහඟු ආදර්ශයක් එහි තිබේ. මිනිසුන් වූ අප හැම දෙනෙක් ද මව් කුසින් බිහි වී, මවගේ සිරුරෙහි ලේ අහර කොටැගෙනැ, හැදී වැඩෙති. කල් ගතවෙත් මැ මවගේ තුරුලෙන් ඉවත් වැ ගොස්, නිදහස් ලොවැ සැරිසරන්නට පටන් ගනිති.

පොල් පැලය හැදී-වැඩෙන විටැ, දිරාපත් වැ පොළොවට පස් වෙන පොල් කටුව සහිත පොල් ලෙල්ල සේ මැ, මිනිසෙකු හැදී වැඩෙද්දී ඔහුට උපත දුන් මව ද මියැදී පොළොවට පස් වී යයි. මෙලෙසින් මිය යන සෑම මිනිසෙකුගේ මැ සිත (විඥ්ඥාණය) පුරුදු පරිදි වෙනත් උපතක් කරා ඇදී යයි. මෙම සිදුවීම් දෙක මැ ලොවෙහි නියාම ධර්මයන් බව අප දැකැ ගත යුතු යැ.

ලොවෙහි ජීවත් වන සතුන් අතරැ, මිනිසා හැරැ අන් කිසි මැ සතෙකු ''මම යැ-මගේ යැ'' යන සක්කාය දිට්ඨිය ඇති වැ ජීවත් වී, මියැ දී යන බවක් නොපෙනේ. එහෙත්, උස් වූ මනැසක් ඇති මිනිසා තමා යනුවෙන් ප්‍රාණියෙක් සිටින බවත්, '''මගේ'' යනුවෙන් ඔහුට බොහෝ දේ ඇතිබවත් තරයේ අදහා ගෙනැ සිටිති.

හරි හැටි පිළිගන්නේ නම්, තමාට කිසි ලෙසකින් අයිති නැති, තමා කැමැති තාක් කල් තමා සතුවැ රඳවා ගත නො හැකි සිරුර ගැන අයිතිය කියා පාන්නට සිතට කිසිම අයිතියක් නැත. එය හුදෙක් පිටතින් පැමිණැ, දිනෙකැ එකතු වී, පසු කලෙකැ මුළුමනින් මැ වෙන් වී යන උපාංගයක් පමණ යැ. සසර යනුවෙන් පැවැත්මක් ගැන අප විශ්වාස කරන්නේ නම්, පැවැත්මෙන් පැවැත්මට මාරු වෙමින් යන විඥාණ ධාතුව මේ වන විට මිනිස් හෝ සත්ව සිරුරු කීයක් පරිහරණය කොටැ අත්හැරැ දමා ඇවිත් ඇතිද යනු කෙසේ නිගමනය කළ හැකි ද ? එය නොකළ හැකි දෙයක් නම්. අත් හරිමින් යාම දසාකාලික වැ සිදුවී ඇති බව අප විසින් පිළිගත යුතු යැ.

අත්හැරීම සහ ඇලීම යන චිත්ත වේග දෙක මැ මිනිස් සිතෙහි පැනැ නඟින අනියත සිතුම් විලාසයන් යැ. තරුණ සිත් මේ අතින් අධික ලෙසැ වේගවත් බව පෙනේ. ළමයින් සෙල්ලම් බඩු කෙරෙහි කැමැත්ත දක්වන්නේ කිසි මැ පදනමක් නැති අයුරිනි. අද එක අතකින් බදා ගන්නා බඩුව හෙට අනිත් අතින් ඉවත දමන්නේ වෙනත් දෙයක් කෙරෙහි සිත ඇදී ගිය නිසා යැ. තරුණ තරුණියන් පෙම් ජවනිකා තුළැ පැටැලෙන්නේ ඒවා බොහෝ කල් පවත්වා ගත නොහැකි බව නො දැන යැ. ඒ නිසා මැ ඒවා බිඳ වැටෙන වාර ද බොහෝ තිබේ. යළිත් එවැනි මැ බැඳීමෙකැ පැටලුණ ද ඒ කිසිවෙකැ තිරසාර බවක් නැත.

මේ වගේ මිනිස් සමාජය පිළිබඳ වැ හරි හැටි අවබෝධ කරැගත් තථාගත බුදු හිමියන් විසින් වෙනත් ආකාරයෙකැ අත් හැරීමක් ලොවට දෙසා වදාරා තිබේ. එය නම් සදාකාලික වැ, තිර ලෙස මැ අත්හැරීම යැ. සසරෙහි පැවැත්මෙන් පැවැත්මට යමින්, එක සිරුරක් අත්හරින්නේ තවත් සිරුරක් වැළැඳ ගැනීමට නම් එය අත් හැරීමක් නොවන බව දහමෙහි පෙන්වා දි තිබේ. ඒ අනුවැ අප විසින් අත්හැරීම සිත තුළින් මැ පුරුදු කළ යුතු යැ. එවිටැ අපට මුළු මහත් සසර පැවැත්ම මැ හැරැ දමන මොහොත උදාවනු ඇත.



සිරිවිමල මුතුකුමාරණ
ඩැන්ඩිනොං

For all your
Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833

## පාලි පාඨ හෙළ බසින්-37

''දිසෝ දිසං යං තංකයිරා
වෙර වා පන වේරිනං
මිච්ඡා පණිහිතං චිත්තං
පාපියෝ නං කතෝ කරේ''
(ධම්මපද 42-චිත්ත වග්ග)

සොර සතුරන් එකිනෙකාට
වෙර වඩන සෙ එයට ද වැඩි
වරදට යොමු වූ තම සිත
තමා පාපියෙකු කරවය

සිරිවිමල මුතුකුමාරණ - ඩැන්ඩිනොං

## Dharma Abeysekera – My Dearest Friend



Sixty five years of unbroken friendship
Through School and University fellowship
Dharma, you were always by my side
In times good and otherwise
Memories stream down thick and fast
Ever so sweet yet all is past

Dharma, my dearest friend
Nearly two months since you passed away
Gone in a flash-peaceful way
A sister to me more than a friend
My loss beyond words hard to mend

You touched one and all With your spirituality
Never gave up any eventuality
Matchless generosityand Compassion to bear
Fitting example to grandkids In your care

May you cut short the cycle Of Samsara
And soon attain the Bliss of Nibbana

Your Ever So Sincere Friend
RANI DE ALWIS
Bandoora - Vic